# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 26 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1083 ඔක්තෝබර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය**

මිල : රු. 1.00 යි තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 40/82.

**නිත්‍ය සේවා සඳහා පෞද්ගලික බස්රථ ධාවකයන් විසින් බස්රථ පාවිච්චි කිරීමට බලය දීම සඳහා ද දිස්ත්‍රික්ක පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති සහ පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති සම්මේලනයක් පිහිටුවීම සඳහා ද මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**2.** (1) මේ පනතේ සාමාන්‍ය පරිපාලනය භාරව සිටිය යුතු (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" ලෙස සඳහන් කරනු ලබන) පෞද්ගලික බස්රථ ගමනාගමන අධ්‍යක්ෂවරයා ලෙස හෝ එම ධුරයෙහි ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

*මේ පනතේ පරිපාලනය.*

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍යවනු ලබන පෞද්ගලික බස්රථ ගමනාගමන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවක් ද වෙනත් නිලධරයන් ද පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අධ්‍යක්ෂවරයාගේ විධාන යටතේ යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ සහකාර අධ්‍යක්ෂවරයකු විසින් කළ හැකි ය; නැතහොත් අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් එසේ කිරීමට බලය පවරනු ලැබූ වෙනත් නිලධරයකු විසින් කළ හැකි ය.

**3.** ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් නොවන වෙනත් කිසිදු තැනැත්තකු විසින් මේ පනත යටතේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලැබූ, තත්කාලයේ බලපවත්නා බස්රථ ධාවන අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර, ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මඟීන් ප්‍රවාහනය පිණිස නිත්‍ය සේවාවක කාර්යය සඳහා නියමිත දිනයේ දී හෝ එදිනට පසු බස්රථයක් පාවිච්චි නොකළ යුතු ය.

*නිත්‍ය සේවා සඳහා බස්රථ ධාවන අවසර පත්‍ර.*

**4.** මේ පනත යටතේ ප්‍රදානය කරනු ලැබූ බස් රථ ධාවන අවසර පත්‍රයක් මඟින්, ඒ අවසර පත්‍රයෙහි සඳහන් කර ඇති කොන්දේසිවලට අනුකූලව ඒ අවසර පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති මාර්ගයේ හෝ මාර්ගවල තැනැත්තන් ගෙන යාම පිණිස නිත්‍ය සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා එම අවසර පත්‍රය දරන්නකුට, තමා ලියාපදිංචි අයිතිකරු වන්නේ යම් බස්රථයක ද ඒ බස්රථය පාවිච්චි කිරීමට හිමිකම තිබිය යුතු ය.

*බස් රථ විසින් බලයලත් මඟීන් ප්‍රවාහනය කිරීම.*

2—ඒ 71773—10,060 (83/08)

**බස් රථ ධාවන අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.**

**5.** (1) මේ පනත යටතේ බස්රථ ධාවන අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් බස්රථයක් සම්බන්ධයෙන් ද ඒ බස්රථයේ ලියාපදිංචි අයිතිකරු විසින්, නියම කරනු ලබන ආකෘතියෙහි අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) බස්රථ ධාවන අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග නියම කරනු ලබන ආකෘතියෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය:—

(අ) ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මගීන් ගෙනයාම සඳහා ඒ බස්රථය පාවිච්චි කිරීමට යෝජනා කරනු ලබන මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර; සහ

(ආ) 6 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර.

**අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම්පත්‍ර පිළිබඳව සුදුස් සක් කිරීම.**

**6.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීමක් ප්‍රදානය කිරීම පිණිස සම්පූර්ණ බලය සහ අභිමතය අධ්‍යක්ෂවරයාට තිබිය යුතු ය.

(2) බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීමක් ප්‍රදානය කිරීම ද අවසර පත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ යම් මාර්ගයක් හෝ මාර්ග සම්බන්ධයෙන් ද ඒ මාර්ගය හෝ මාර්ග ද පිළිබඳව තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂවරයා විසින්, ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මගීන් ප්‍රවාහනය සඳහා පහසුකම් අවශ්‍ය වන සහ පහසුකම් සලස්වන තැනැත්තන්ගේ යහපත ද ඇතුළුව සාමාන්‍යයෙන් මහජනතාවගේ යහපත පිළිබඳව මූලිකව සැලකිල්ල දැක්විය යුතු අතර ඒ අභිමතය පාවිච්චි කිරීමේ දී පහත දැක්වෙන කාරණා පිළිබඳව විශේෂයෙන් සැලකිල්ල දැක්විය යුතු ය:—

(අ) මහජන යහපත උදෙසා යෝජිත මගීන් ගෙනයාම අවශ්‍ය වන හෝ හිතකර වන ප්‍රමාණය;

(ආ) යෝජිත මාර්ගය හෝ මාර්ගවල යෝග්‍යතාවය;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ එවැනි යම් මාර්ගයක අවශ්‍යතා දැනටමත් සපුරා ඇත් නම් එම ප්‍රමාණය;

(ඈ) (ප්‍රමාණවත්, සුදුසු සහ කාර්යක්ෂම සේවා සැලසීම ද ඇතුළුව) රථවාහන ගමනාගමනය සම්බන්ධයෙන් ප්‍රදේශය සමස්තයක් වශයෙන් ගත් කළ එහි අවශ්‍යතා සහ දුම්රියෙන් මගී ප්‍රවාහනය ද ඇතුළු සියලු මගී ප්‍රවාහන ක්‍රම සම්බන්ධීකරණය කිරීම;

(ඉ) අධ්‍යක්ෂවරයාගේ මතය අනුව යම් ප්‍රදේශයක හෝ යම් මාර්ගයක ඇති (දුම්රිය මගින් සපයනු ලබන පහසුකම් ද ඇතුළුව) යම් ප්‍රවාහන පහසුකම්, එම ප්‍රදේශය හෝ එම මාර්ගය ඇතුළත මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සාධාරණ ගාස්තුවකට ඉටු කිරීමට ප්‍රමාණවත් සහ කාර්යක්ෂම වන කවර වූ හෝ අවස්ථාවක දී එකී ප්‍රවාහන පහසුකම් සමඟ තරඟ කිරීම සඳහා සාරානුකූලව එම ප්‍රදේශයේම හෝ සාරානුකූලව එම මාර්ගයේම මගීන් ගෙනයාමට බලය දෙන්නා වූ අවසරපත්‍රයක් ලබාදීම හිත කර නොවීම.

7. (1) නියම කරනු ලබන ගාස්තුවක් හෝ ගාස්තු යම් තැනැත්තකු විසින් අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබීම මත හැර, මේ පනත යටතේ අධ්‍යක්ෂවරයා විසින් ඒ තැනැත්තාට බස්රථ ධාවන අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතු ය. බස් රථ ධාවන අවසර පත්‍ර වලංගු වන කාලය ආදිය.

(2) සෑම බස්රථ ධාවන අවසර පත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු ය; සහ

(ආ) කලින් අවලංගු කරනු ලැබුවේ නම් මිස, එය නිකුත් කරනු ලැබූ දින සිට මාස දොළහක කාල සීමාවක් සඳහා බලාත්මක විය යුතු ය.

8. මේ පනතේ සහ එය යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව— අවසර පත්‍රවලට අනුයුක්ත කළ හැකි කොන්දේසි.

(අ) අයකරනු ලැබිය යුතු ගාස්තු අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ගාස්තු විය යුතු බවට;

(ආ) අවසර පත්‍රයෙහි අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස් රථය අවසර පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති ඒ මාර්ගයේ හෝ මාර්ගවල ධාවනය කළ යුතු බවට;

(ඇ) (අවශ්‍යවන අවස්ථාවල දී) කාල සටහනේ සහ ගාස්තු චක්‍රයේ පිටපත් අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථයේ රැගෙන යා යුතු අතර එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට;

(ඈ) අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථය සියලු අවස්ථාවන්හි දී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු බවට;

(ඉ) බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව කාර්යයෙහි නිරතවන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන හෝ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයන්, අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථයේ රියැදුරු සහ කොන්දොස්තර පිළිබඳව පිළිපදිනු ලබන බවට

නියම කරන කොන්දේසි ඇතුළුව, මහජනයාගේ ආරක්ෂාව සහ පහසුව සුරක්ෂිත කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි සියලු කොන්දේසි මේ පනත යටතේ නිකුත් කරනු ලබන සෑම බස්රථ ධාවන අවසර පත්‍රයකට ම අනුයුක්ත කළ යුතු ය.

අවසර දෙනු ලැබූ බස්රථයේ විස්තර අවසර පත්‍රයේ දැක්වීම.

**9.** අධ්‍යක්ෂවරයා විසින්, මේ පනත යටතේ බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී, එම අවසර පත්‍රය මගින් පාවිච්චි කිරීම සඳහා බලය දෙනු ලබන බස්රථයේ හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි තමා සලකන වෙනත් විස්තර එම අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.

**10.** මේ පනත යටතේ බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා වෙත, මේ පනතේ විධිවිධානවලට හෝ එය යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ක්‍රියා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා කල්පනා කරන විධාන ඔහු විසින් නිකුත් කළ හැකි අතර එවැනි යම් විධාන නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් ඒ විධානවල නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ දී ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

අවසර පත්‍ර පැවරිය නොහැකි බව.

**11.** මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ බස්රථ ධාවන අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකුට පැවරිය නොහැකි අතර ඒ අනුව එවැනි යම් පැවරීමක් හිස් හා ශූන්‍ය විය යුතු ය.

අවසර පත්‍ර දරන්නන් විසින් විස්තරවල යම් වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු බව.

**12.** බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා විසින්, බස්රථ ධාවන අවසර පත්‍රයක් සඳහා වූ සිය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තරවල යම් වෙනසක් සිදු වී දින තිහක් ඇතුළත ඒ වෙනස පිළිබඳව අධ්‍යක්ෂවරයාට ලියවිල්ලකින් දැන්විය යුතු ය.

අවසර පත්‍ර අලුත් කිරීම.

**13.** මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත—

(අ) බස්රථ ධාවන අවසර පත්‍රය දරන්නා විසින්, මේ පනතේ විධිවිධාන අනුව හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් අනුව ක්‍රියාකර ඇති බවට හෝ මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ යම් වරදකට වරදකරු කරනු නොලැබූ බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන්නේ නම්; සහ

(ආ) අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව, බස්රථ ධාවන අවසර පත්‍ර දරන්නා විසින් ගෙවනු ලබයි නම්

අධ්‍යක්ෂවරයා විසින් ඒ අවසර පත්‍රය එය අවසන් වන දින සිට එක් අවුරුද්දක කාල සීමාවක් සඳහා අලුත් කළ හැකි ය.

අවසර පත්‍රයක් අවලංගු කිරීම.

**14.** (1) බස්රථ ධාවන අවසර පත්‍රය දරන්නා විසින්—

(අ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් උල්ලංඝනය කර ඇති බවට ;

(ආ) 10 වන වගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූලව ක්‍රියා කර නොමැති බවට ; හෝ

(ඇ) මේ පනත යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරක හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක, සපයා ඇති යම් විස්තර ඔහුගේ දැනුම් අනුව ව්‍යාජ බවට හෝ සාවද්‍ය බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින් ඒ බස්රථ ධාවන අවසර පත්‍රය අවලංගු කළ හැකි ය.

(2) අධ්‍යක්ෂවරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීමේ කාලය අවසන් වන තුරු හෝ අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් එම අභියාචනය පිළිබඳව සුදුස්සක් කරන තුරු, (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතු ය.

15. අධ්‍යක්ෂවරයා විසින්, බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක, තම තීරණය සහ ඒ සඳහා වූ හේතු අධ්‍යක්ෂවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍ර දරන්නාට දැනුම් දිය යුතු බව.

16. (1) (අ) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ අභියාචන.

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින්

අධ්‍යක්ෂවරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත්වූ බස්රථ ධාවන අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම්කරු හෝ බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා විසින් තමා වෙත ඒ තීරණය දැනුම් දුන් දින සිට දින දහහතරක් ඇතුළත තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් අභියාචනයක දී ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී අවසර පත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස හෝ අධ්‍යක්ෂවරයාට විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම හෝ

කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූලව අධ්‍යක්ෂවරයා ක්‍රියා කළ යුතු ය.

17. මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ සෑම බස්රථ ධාවන අවසර පත්‍රයක්ම, අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් බස්රථයක් සම්බන්ධයෙන් ද ඒ බස්රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය. අවසර පත්‍රය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

අධ්‍යක්ෂවරයා අමාත්‍ය වරයාගේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු බව.

**18.** අධ්‍යක්ෂවරයා විසින් මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු ය.

වාර්තා ආදිය.

**19.** අධ්‍යක්ෂවරයා විසින් මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා ඔහුට අවශ්‍ය වනු ලබන යම් වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීමක් දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත තමා වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරමින් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා වූ යම් තැනැත්තකුට ලියවිල්ලකින් දැනුම් දිය හැකි අතර ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

දිස්ත්‍රික්ක පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති පිහිටුවීම.

**20.** (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, නියමිත දිනට පසු හැකිතාක් ඉක්මනින්—

(අ) සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ම (මෙහි මින්මතු "දිස්ත්‍රික්ක සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිස්ත්‍රික්ක පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිතියක් පිහිටු විය යුතු ය ; තවද

(ආ) එසේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික්ක සමිතියට නමක් යෙදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම දිස්ත්‍රික්ක සංගමයක් ම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ සමිතිය පිහිටුවනු ලැබූ නියමය මගින් ඊට යොදන ලද නාමයෙන් නඩු පැවරීමත් නඩු පවරනු ලැබීමත් කළ හැකි ය.

(3) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා වන (මෙහි මින්මතු "පෞද්ගලික බස්රථ ධාවකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම තැනැත්තෙක්ම, බස්රථ ධාවන අවසර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන මාර්ගයේ ආරම්භක ස්ථානය පිහිටා තිබෙන්නේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක සමිතියේ සාමාජිකයකු විය යුතු ය.

දිස්ත්‍රික්ක සමිතියක කර්තව්‍ය.

**21.** දිස්ත්‍රික්ක සමිතියක කර්තව්‍ය විය යුත්තේ—

(අ) සමිතියේ සාමාජිකයන් විසින් දිස්ත්‍රික්කය තුළ සලසන ලද නිත්‍ය පෞද්ගලික බස්රථ සේවා, මහජනතාවගේ ගමනාගමන අවශ්‍යතා සපුරාලන බවට වගබලා ගැනීම ;

(ආ) බස්රථ ධාවන කාර්ය පිළිවෙල සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මගීන්ගේ ආරක්ෂාව සහ පහසුව ද, සලසන ලද සේවාවල කාර්යක්ෂමතාවය ද සාක්ෂාත් කිරීම ;

(ඈ) අවශ්‍ය වනු ලබන බස් නැවතුම් පොළ භාරකරුවන්, ටිකට් පරීක්ෂකවරුන් සහ වෙනත් සේවක පිරිස් පත් කිරීම සහ ඔවුන් සම්බන්ධ සියලු විනයානුකූල කරුණු පිළිබඳව ක්‍රියා කිරීම ;

(ඉ) සාමාජිකයන් වෙනුවෙන් නැවතුම් පොළ ගාස්තු සහ වෙනත් ගාස්තු ගෙවීම ;

(ඊ) සමිතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වනු ලබන ගාස්තු සාමාජිකයන්ගෙන් අය කිරීම ;

(උ) අවශ්‍ය අවස්ථාවල දී මාර්ග අවසර පත්‍රවල කළ යුතු වෙනස් කිරීම් සමිති සම්මේලනය මගින් අධ්‍යක්ෂවරයාට නිර්දේශ කිරීම ; සහ

(ඌ) ආපසු පැමිණීමේ කාල සටහන් සහ ගෙනයන මගීන් සංඛ්‍යාව සමානව බෙදීමට වගබලා ගැනීම පිණිස වෙනත් දිස්ත්‍රික්ක සමිති සහ සමිති සම්මේලනය සමග සහයෝග යෙන් ක්‍රියා කිරීම සම්බන්ධීකරණය කිරීම.

**දිස්ත්‍රික්ක සමිතියක කටයුතු කළමනාකරණය.**

22. (1) සෑම දිස්ත්‍රික්ක සමිතියක් විසින් ම සමිතියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හා තවත් සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත කළමනාකරණ කාරක සභාවක් තමන් අතුරින් තෝරා පත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම දිස්ත්‍රික්ක සමිතියක් විසින් ම, කළමනාකරණ කාරක සභාව තෝරා පත් කර ගැනීමෙන් පසුව, කළමනාකරණ කාරක සභාවේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු, පෞද්ගලික බස් රථ ධාවකයන්ගේ සමිති සම්මේලනයට සිය නාමිකයා වශයෙන් තෝරා පත් කරනු ලැබිය යුතු ය.

(3) දිස්ත්‍රික්ක සමිතියක කළමනාකරණ කාරක සභාවේ ධුර කාලය එක් වර්ෂයක් විය යුතු ය.

**පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති සම්මේලනය පිහිටුවීම.**

23. (1) (මෙහි මින්මතු "සමිති සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන) පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ සමිති සම්මේලනය යනුවෙන් හැඳින්විය යුතු සමිති සම්මේලනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය දිස්ත්‍රික්ක සමිතිවල නාමිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් සමිති සම්මේලනයට පවරා ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය ; තවද ඒ නාමයෙන් නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) සමිති සම්මේලනයේ මුද්‍රාව—

(අ) සමිති සම්මේලනයේ විධායක කාරක සභාව භාරයේ තිබිය යුතු ය ;

(ආ) සමිති සම්මේලනයේ විධායක කාරක සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ අනුඥව ඇතිව හා යටත් පිරිසෙයින් විධායක කාරක සභාවේ සාමාජික යන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශ යෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

සමිති සම්මේලනයේ කර්තව්‍ය.

24. (අ) දිස්ත්‍රික්ක සමිතිවල කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(ආ) යම් දිස්ත්‍රික්ක සමිතියක් හෝ සමිති විසින් සමිති සම්මේලනයට යොමු කරනු ලැබූ ආරාවුල් හා මත භේද බේරුම් කිරීම;

(ඇ) අවශ්‍යයයි සලකනු ලබන මාර්ග බලපත්‍ර වෙනස් කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට නිර්දේශ කිරීම;

(ඈ) රටේ සියලු ප්‍රදේශවල ප්‍රවාහන අවශ්‍යතා තක්සේරු කිරීම හා සියලු ප්‍රදේශයන් සඳහා ප්‍රමාණවත් සේවයක් සලසනු ලැබීමට සහතික වීම; සහ

(ඉ) පෞද්ගලික බස්රථ කර්මාන්තයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට හා අධ්‍යක්ෂ වරයාට කරුණු නියෝජනය කිරීම

සමිති සම්මේලනයේ කර්තව්‍ය විය යුතු ය.

සමිති සම්මේලනයේ කටයුතු කළමනාකරණය.

25. (1) සමිති සම්මේලනයේ කටයුතු—

(අ) සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හා සමිති සම්මේලනයේ සාමාජිකයන් විසින් ඒ කාර්යය සඳහා ඔවුන් අතුරින් තෝරාපත් කරනු ලබන වෙනත් සාමාජික යන් තිදෙනකුද;

(ආ) අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන පෞද්ගලික බස් රථ ගමනාගමන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකුද

යන අයගෙන් සමන්විත සමිති සම්මේලනයේ විධායක කාරක සභා වකින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සමිති සම්මේලනයේ විධායක කාරක සභාවේ ධුර කාලය එක් වර්ෂයක් විය යුතු ය.

දිස්ත්‍රික්ක සමිතිවල හා සමිති සම්මේලනයේ සාමාන්‍ය බලතල.

26. මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, දිස්ත්‍රික්ක සමිතියක කළමනාකරණ කාරක සභාවට හෝ සමිති සම්මේලනයේ විධායක කාරක සභාවට දිස්ත්‍රික්ක සමිතියක් හෝ සමිති සම්මේලනය වෙනුවෙන් අවස්ථාවෝචිත පරිදි දිස් ත්‍රික්ක සමිතියක හෝ සමිති සම්මේලනයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන කවර වූ හෝ සියලුම ක්‍රියා, කාරණා හා දේවල් කිරීමට, ඉටු කිරීමට, ක්‍රියාත්මක කිරීමට බලය ඇත.

දිස්ත්‍රික්ක සමිතිවල හා සමිති සම්මේලනයේ කාර්ය පටිපාටිය ආදිය.

**27.** මේ පනත යටතේ, දිස්ත්‍රික්ක සමිතිවල කළමනාකරණ කාරක සභා හා සමිති සම්මේලනයේ විධායක කාරක සභාව තෝරා පත් කර ගැනීම සඳහා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ දිස්ත්‍රික්ක සමිතිවල හා ඒවායේ කළමනාකරණ කාරක සභාවල ද සමිති සම්මේලනයේ හා එහි විධායක කාරක සභාවේ ද රැස්වීම් කැඳවීම හා ඒවායෙහි කටයුතු කිරීම සම්බන්ධයෙන් නියෝග පැනවිය හැකි ය. එවැනි යම් නියෝගවලට යටත්ව, දිස්ත්‍රික්ක සමිතිය, සමිති සම්මේලනය, කාරක සභාව හෝ විධායක කාරක සභාව විසින් සිය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

පෞද්ගලික බස්රථ සඳහා ප්‍රසිද්ධ බස් නැවතුම් පොළවල්.

**28.** (1) යම් නාගරික ප්‍රදේශයක් සඳහා වන පළාත් පාලන ආයතනය විසින් පෞද්ගලික බස්රථවල තනි ප්‍රයෝජනය සඳහා එම ප්‍රදේශය ඇතුළත ප්‍රසිද්ධ බස් නැවතුම් පොළවල් එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළාත් පාලන ආයතනය විසින් යම් නාගරික ප්‍රදේශයක් සඳහා ප්‍රසිද්ධ බස් නැවතුම් පොළවල් සඳහා යොදන ලද විධිවිධාන අසතුටුදායක බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන යම් අවස්ථාවක, ඔහු විසින් පළාත් පාලන ආයතනයේ අනුමතය ඇතිව සහ මෝටර් වාහන කොමසාරිස්වරයා විමසීමෙන් පසු, එම ප්‍රදේශය ඇතුළත ප්‍රසිද්ධ බස් නැවතුම් පොළවල් පිහිටුවා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන්නා වූ ද සාදනු ලබන නියෝගවලට අනුකූල වන්නා වූ ද විධිවිධාන යෙදීමට අධ්‍යක්ෂවරයාට බලය පැවරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

**29.** (1) මේ පනත මගින් නියම කරනු ලැබීමට අවශ්‍ය කරන ලද්ද වූ හෝ මේ පනත මගින් නියෝග සෑදීමට බලය දෙන ලද්ද වූ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානි කර නොවන පරිදි, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සියලු කරුණු හෝ ඒවා අතුරින් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බස්රථ ධාවන අවසර පත්‍රවල අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථවල රැගෙන යා යුතු පුවරු හා සලකුණු;

(ආ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බස්රථ ධාවන අවසර පත්‍රවල අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් රැගෙන යා යුතු ලේඛන හා ඒවායෙහි ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බස්රථ ධාවන අවසර පත්‍රයක අධිකාරය යටතේ බස්රථයක් පාවිච්චි කරනු ලබන යම් තැනැත්තකු විසින් පිළිපැදිය යුතු සම්මතයන් හා ඒ සම්මතයන් උල්ලංඝනය කරන්නා වූ ක්‍රියා හෝ නොකර හැරීම් තහනම් කිරීම;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බස්රථ ධාවන අවසර පත්‍රයක අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථයක ගමන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා ;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන බස්රථ ධාවන අවසර පත්‍ර දරන්නන් විසින් ඒ අවසර පත්‍රවල අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් වශයෙන් සේවයේ නියුක්ත කරනු ලබන තැනැත්තන් හා ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසාන කරන වේලාවන් හා ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් තබාගත යුතු වාර්තා ;

(ඊ) මේ පනත යටතේ තබා ගනු ලබන වාර්තා ආරක්ෂා කිරීම, නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධරයාගේ ඉල්ලීම මත ඒ පරීක්ෂණයේ කාර්ය සඳහා ඒ වාර්තා ඉදිරිපත් කිරීම ;

(උ) දිස්ත්‍රික්ක සමිතිවල හා සමිති සම්මේලනයේ කටයුතු කර ගෙන යාම සඳහා වූ කාර්ය පටිපාටිය හා ඒවා විසින් කර්තව්‍ය ඉටු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වැරදි.

**30.** මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන හෝ සිය දැනුම අනුව ව්‍යාජ හෝ සාවද්‍ය වන්නා වූ යම් විස්තර ඇතුළත් යම් වාර්තාවක්, ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් සපයනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

දණ්ඩන.

**31.** මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

32. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක— *පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ බැඳීම.*

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, වරද සිදු කරනු ලබන අවස්ථාවෙහි එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයා, ලේකම්වරයා හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, වරද සිදු කරනු ලබන අවස්ථාවෙහි ව්‍යාපාර ආයතනයෙහි හවුල් කරුවකු වූ සෑම තැනැත්තකුම

වරද සිදු කරන ලද්දේ තම දැනුම හෝ අනුසහයකත්වය නොමැතිව බව හා තම කර්තව්‍යයන්ගේ ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු සලකා බලා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ පරිදි ඔහු විසින් වරද සිදු කිරීම වැළැක්වීමට පූර්ණ නිසි සැලකිල්ලක් දැක් වූ බව ඔප්පු කරනු ලබන්නේ නම් මිස, එම වරදට වරදකරු සේ සලකනු ලැබිය යුතු ය.

33. මෝටර් වාහන පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *203 වන අධිකාරය සංශෝධනය කිරීම.*

(1) එහි 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ලියාපදිංචි අයිතිකරු—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් ; හෝ

(ආ) කාලීන බස්රථ සේවා සඳහා බස්රථ ධාවන අවසර පත්‍ර සඳහා උචිතතා සහතිකයක් දරන්නා ; හෝ

(ඇ) 1983 පෞද්ගලික බස්රථ සේවා පනත යටතේ ප්‍රදානය කරනු ලැබූ නිත්‍ය බස්රථ සේවා සඳහා බස්රථ ධාවන අවසර පත්‍රයක් දරන්නා

වන්නේ යම් බස්රථයක ද ඒ බස්රථය සඳහා හැර, කිසිදු බස්රථ බලපත්‍රයක් මේ කොටස යටතේ නිකුත් කරනු නොලැබිය යුතු ය." ;

(2) එහි 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කිසිදු බස්රථයක්, මේ කොටස යටතේ කොමසාරිස්වරයා විසින් හෝ 1983 පෞද්ගලික බස්රථ සේවා පනත යටතේ පෞද්ගලික බස්රථ ගමනාගමන අධ්‍යක්ෂවරයා විසින් හෝ ප්‍රදානය කරනු ලැබූ හා තත්කාලයේ බලාත්මකව පවත්නා බස්රථ ධාවන අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර නියමිත දිනයෙහි හෝ ඉන් පසුව යම් මහා මාර්ගයක පාවිච්චි නොකළ යුතු ය."; තව ද

(3) එහි 239අා වගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් :—

"නිත්‍ය බස්රථ සේවා සඳහා බස්රථ ධාවන අවසර පත්‍ර ප්‍රදානය තහනම් කිරීම.

239අා. මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් තැනැත්තකුට නිත්‍ය බස්රථ සේවයක් සඳහා බස්රථ ධාවන අවසර පත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.".

නියමිත දිනයට පෙරාතුව නිකුත් කරන ලද අවසර පත්‍ර වලංගු කිරීම.

**34.** (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද පෞද්ගලික බස්රථ ගමනාගමන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගාස්තුවකට හෝ ත්‍යාගයකට මගීන් ගෙන යාමට නිත්‍ය බස්රථ සේවයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා බස්රථයක් පාවිච්චි කිරීමට යම් තැනැත්තකුට බලය පවරමින් නියමිත දිනයට පෙරාතුව නිකුත් කරනු ලැබූ සෑම අවසර පත්‍රයක්ම නීත්‍යානුකූල හා වලංගු ලෙස නිකුත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ ද විය යුතු ය; තව ද ඒ අනුව එවැනි යම් අවසර පත්‍රයක් ප්‍රකාර කරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ දෙයක් නීත්‍යානුකූල ලෙස කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ ද විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ පරිදි එවැනි යම් අවසර පත්‍රයක් නියමිත දිනයට පසුව යම් දිනයක අවසන්වීමට නියමිතව ඇති අවස්ථාවක, එය ඊට කලින් අවලංගු කරනු ලැබුවේ නම් මිස, ඒ අවසර පත්‍රය මේ පනතේ කාර්ය සඳහා පෞද්ගලික බස් රථ ගමනාගමන අධ්‍යක්ෂවරයා විසින් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බස්රථ ධාවන අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර ඇති අවසර පත්‍රය ඉකුත්වීමේ දිනය දක්වා එය වලංගු විය යුතු ය.

**35.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍ය වලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

" බස්රථය " යන්නට, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" මගියා " යන්නට, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" නියමිත " යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගය කින් නියමිත යන්න අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය